THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# SUGGESTED SOLUTIONS

NOT FOR SALE

## KE3 (B) – Fundamentals of Law

## මාර්තු 2018

All Rights Reserved

## 1 කොටස

**පිළිතුරු අංක 01**

1.1

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 1.1.1 |
| පිටු අංක: 6 |
| **නිවැරදි පිළිතුර: C** |

1.2

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.1.1 |
| පිටු අංක: 36 |
| **නිවැරදි පිළිතුර : C** |

1.3

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.4.1 |
| පිටු අංක: 92/93 |
| **නිවැරදි පිළිතුර : A** |

1.4

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.6.1 .9.1.1 |
| පිටු අංක: 254 |
| **නිවැරදි පිළිතුර : C** |

1.5

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 4.1.1 |
| පිටු අංක: 102 |
| **නිවැරදි පිළිතුර : C** |

1.6

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.6.1 |
| පිටු අංක: 138 |
| **නිවැරදි පිළිතුර : D** |

1.7

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.7.5 |
| පිටු අංක: 148 |
| **නිවැරදි පිළිතුර : C** |

NOT FOR SALE

1.8

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 7.3.2 | |
| පිටු අංක: 207 | |
| **නිවැරදි පිළිතුර : A** | |

1.9

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 7.4.2 | |
| පිටු අංක: 219 | |
| **නිවැරදි පිළිතුර : C** | |

1.10

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1 | |
| පිටු අංක: 232/233 | |
| **නිවැරදි පිළිතුර : B** | |

**(2 x 10 = මුළු ලකුණු 20)**

NOT FOR SALE

# 2 කොටස

**පිළිතුර 02**

2.1

ඉගෙනුම් ප්‍රතිඵල: 1.3.1

පිටු අංක: 16

පහත සඳහන් කරුණු ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලයට යටත් වේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කරුණු
- මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- අවසාන අභියාචනා බලය
- උපදේශන අධිකරණ බලය
- ඡන්ද පෙත්සම්
- පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම්
- පාර්ලිමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා ඇති ඕනෑම කරුණක්

2.2

ඉගෙනුම් ප්‍රතිඵල: 2.3.1

පිටු අංක: 64

"බලරහිත"/ "අවලංගු ගිවිසුමකට" නීතිමය බලපෑමක් නොමැති බැවින්, ඉන් කිසිදු පාර්ශ්වයකට බැඳීමක් ඇති නොකරයි. මෙයාකාර ගිවිසුම් සම්පූර්ණයෙන්ම "ශූන්‍ය හා හිස්වේ".

"බලරහිත කළ හැකි"/ "අවලංගු කළ හැකි" ගිවිසුමක් යනු දෝෂයක් තිබීම හේතුවෙන් පාර්ශ්වයන්ගේ මනාපය පරිදි, අවසන් කරුනු ලැබිය හැකි හෝ දෝෂය තිබුනද, දිගටම කරගෙන යාමට හැකි ගිවිසුමකි.

2.3

ඉගෙනුම් ප්‍රතිඵල: 4.1.1

පිටු අංක: 103

නීතියෙන් පිළිගනු ලබන ගනුදෙනු කළ හැකි ලියවිලි සමහරක් පහත දැක්වේ.

- විනිමය බිල්පත්
- චෙක්පත්
- පොරොන්දු නෝට්ටු
- ලාභාංශ බලපත්‍ර
- කොටස් බලපත්‍ර
- ධාරකයාට ගෙවිය යුතු ණයකර

NOT FOR SALE

2.4

| ඉගෙනුම් ප්‍රතිඵල: 7.2.1 |
|---|
| පිටු අංක: 217 |
| පාරිතෝෂිකය = ½ × (සේවා නියුක්තියේ අවසන් මාසය සඳහා ලබාගත් වැටුප/වේතනය) × සම්පූර්ණ කර ඇති සේවා වර්ෂ ගණන<br>එබැවින්, දෙන ලද කරුණු අනුව සුනිල්ගේ පාරිතෝෂිකය = ½ x 75,000 x 18 = රු. 675,000 |

2.5

| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1 |
|---|
| පිටු අංක: 229 |
| මහාධිකරණය විසින් මුදල් විශුද්ධිකරණය කිරීමේ වරදට, වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු පහත සඳහන් දඬුවම් සඳහා යටත් වන්නේය:<br>• දඩයක් (එම දේපලෙහි වටිනාකමට නොඅඩු හා එහි වටිනාකම මෙන් 3 ගුණයකට නොවැඩි හෝ )<br>• බන්ධනාගාර ගත කිරීමක් (වසර 5 - 25 අතර කාලයකට)<br>• දඩයකට හා බන්ධනාගාර ගතකිරීම යන දෙකටම හෝ යටත් වන්නේය. |

**(2 x 5= මුළු ලකුණු 10)**

NOT FOR SALE

## 3 කොටස

**පිළිතුර 03**

(a)

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.1.1 | |
| පිටු අංක: 49 | |

- මෙම ප්‍රශ්නයේදී අප විසින් සලකා බැලිය යුත්තේ සරගම විසින් ගිවිසුමේ නියමයක් කඩකිරීම, කොන්දේසියක් හෝ ප්‍රතිඥාහාරයක් කඩකිරීමක්ද යන්නයි.

- කොන්දේසියක් යනු ගිවිසුමක මූලය හෝ පදනම වන අතර එය කඩකිරීමෙන් ගිවිසුම අවසන් කළ හැකිය.

- ප්‍රතිඥාහාරයක් ගිවිසුමක මූලය දක්වා දිවයාමක් නොවූවත් ප්‍රතිඥාහාරය ඉටුකළ යුතු වේ. එය ඉටු නොකිරීමෙන් ගිවිසුමේ හරයට බලපෑමක් ඇති නොවේ.

- *බෙටිනි එදිරිව ගයි (1876) Q.B.D. 183, විනිශ්චිත නඩුවේදී සමාන කරුණු සාකච්ඡා කළ අතර (පෙර පුහුණුවීම් සඳහා ප්‍රසංගයේ දිනයට දින 6 කට පෙර නොපැමිණීම) බෙටිනි විසින් කරන ලද කඩකිරීම කොන්දේසියක් කඩ කිරීමක් නොවන බව තීරණය කරන ලදී. එය ප්‍රතිඥාහාරයක් කඩ කිරීමක් පමණි. එම නිසා ගිවිසුම ප්‍රජ ඟනය (අවසන්) කළ නොහැකි අතර, ගයි ගිවිසුම ඉටුකිරීමට බැඳේ.*

- *ඉහත නඩුවේ තීරණය අදාළ කර ගැනීමේදී සරගම ගිවිසුමේ ප්‍රතිඥාහාරයක් කඩකර ඇති අතර, කොන්දේසියක් කඩකර නැත.*

- *මෙහි ප්‍රතිඵලයක් ලෙස රවිට, සරගම සමඟ ඇති ගිවිසුම අවසන් කිරීමට නොහැකිය.*

(b)

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.4.1 | |
| පිටු අංක: 68 | |

<u>නඩුවේ නම:</u>

සමාන කරුණු ටේලර් එදිරිව කැඩ්වෙල් ***(1983- 122 ER 309)*** නඩුවේදී සාකච්ඡා කරන ලදී.

<u>නඩුවේ කරුණු:</u>

T, C ගෙන් සංගීත ශාලාවක් කුලියට ගත්තේය. එහෙත් පළමුවන රඟ දැක්වීමට පෙර ශාලාව ගින්නෙන් දැවී විනාශ විය. මෙම කාලය වන විට රඟ දැක්වීම් සූදානම් කිරීම සඳහා T යම් යම් වියදම් දරා තිබුණි. T මෙම වියදම් මත සිදු වූ හානිය නිසා C ගෙන් වන්දි ඉල්ලා සිටියේය.

තීන්දුව : ශාලාව විනාශ වූයේ ගිවිසුමේ පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් කුමන හෝ පාර්ශ්වකරුවකුගේ වරදක් නිසා නොවේ. එම නිසා පාර්ශ්වකරුවන්ට ගිවිසුම යටතේ තිබූ බැඳීම් වලින් නිදහස් වේ. එයට හේතුව ගිවිසුම ව්‍යාර්ථවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ හානිවලට C ගෙන් වන්දි ඉල්ලීමට T ට හිමිකමක් නැත.

මෙම සිදුවීමට අනුව සංගිත ශාලාව පාර්ශ්වයන්ගේ වරදකින් තොරව, විනාශ වී ඇත.

එවැනි අවස්ථාවකදී ගිවිසුම ව්‍යාර්ථවීම හේතුවෙන් පාර්ශ්වයන් ගිවිසුමේ වගකීම්වලින් නිදහස් කිරීමට හැකිය.

එම නිසා, තොම්සන්ස් විසින් දරන ලද වියදම් යටතේ ඔවුන්ගේ ප්‍රචාරණ වැඩ පිළිවෙල සඳහා දරන ලද වියදම් වන්දි වශයෙන් අයකර ගැනීමට තොම්සන්ස්ට හිමිකමක් නැත.

**(මුළු ලකුණු 10)**



NOT FOR SALE

**පිළිතුර 04**

(a)

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.3.1 |
| පිටු අංක: 88 |

- භාණ්ඩ බාරදීමේ තත්ත්වයට පත්කිරීම සඳහා විකුණුම්කරු යමක් කළයුතුව ඇති විට, එය විකුණුම්කරු විසින් සිදු කිරීමෙන් අනතුරුව ගැණුම්කරුට දැනුම් දුන්විට, අයිතිය පැවරේ.

- මෙයට, සමාන කරුණු සී/ස පිලිප් හෙඩ් සහ පුත්‍රයෝ එදිරිව, ෂෝෆරන්ට්ස් *[1970] Lloyd 's Rep. 140 නඩුවේදී සාකච්ඡා කරන ලදී.*

  මෙම නඩුවට අනුව, S විසින් P ගෙන් බුමුතුරුණක් මිලට ගනී. එම බුමුතුරුණු එලීමට නියමිත ස්ථානයට ගෙනවිත් බාරදුන් විට, එය මසා එවන ලෙසට P වෙත ආපසු යැවීය. P පසුවදා එය ශක්තිමත්ව මිටියක් බැඳ එවුවත්, යමකු විසින් සොරකම් කර ඇත.

  **තීන්දුව:**

  බුමුතුරුණු සොරකම් කරන ලද අවස්ථාවේදී මිටි බැඳ තිබීමෙන් අදහස් වන්නේ, එය බාරදීමට හැකි තත්ත්වයක නොතිබුණ බවයි. ඒ අනුව ඉහත රීතිය (ඉහත අංක 01) අදාල නොවන අතර, S විසින් P ට ගෙවීමට වගකීමක් නැත.

- ඉහත නඩු තීන්දුවේ කරුණු දී ඇති තත්ත්වයන්ට සම්බන්ධ කරන්න.

- J ගේ ගරාජයට දමන අවස්ථාවේදී මුළුතැන්ගේ රාක්ක පෙට්ටි (pantry cupboards) බාරදීමට හැකි තත්ත්වයේ නොතිබුනි. මක්නිසාද ඒවා එකලස්කර සවිකර දිය යුතුව තිබුණ.

- පාර්ශවයන් භාණ්ඩ පැවරිය යුතු යැයි අපේක්ෂා කරන අවස්ථාවේදී ගැණුම්කරුවන්ට භාණ්ඩවල හිමිකම පැවරේ. මෙම අවස්ථාවේ භාණ්ඩ J වෙත, පැවරීමට අපේක්ෂා කරන්නේ, M විසින්, සෙනසුරාදා දින සවි කිරීමෙන් අනතුරුවයි.

- එම නිසා රාක්ක පෙට්ටි (pantry cupboards), භාණ්ඩ සොරකම් කරන අවස්ථාව වන විට, J වෙතට පැවරීමක් නොවී ඇත.

NOT FOR SALE

(b)

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.1.1 | |
| පිටු අංක: 124 | |

අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය සිදුවන්නේ පුද්ගලයෙකුට වෙනත් අයෙකුගේ දේපලක් බාරදී ඇතිවිට, සහ එම දේපල ආරක්ෂා කිරීමට යමක් කිරීම අවශ්‍ය වන විටය.

අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය නිර්මානය වීමට පහත සඳහන් කොන්දේසි සපුරා ලිය යුතුවේ:

1. ප්‍රධානියාගේ උපදෙස් ලබාගැනීමට නොහැකිව තිබිය යුතුය.
2. නියෝජ්‍යත්වය ඇතිකර ගැනීම සඳහා සත්‍ය සහ නිශ්චිත, වාණිජ අවශ්‍යතාවයක් තිබිය යුතුය.
3. නියෝජිතයා විසින් සියළුම පාර්ශ්වයන්ගේ යහපත සඳහා සද්භාවයෙන් ක්‍රියාකළ යුතුය.

මෙම සිදුවීමේදී, B ට A ගේ දුරකථන අංකය තිබුණ බැවින් උපදෙස් ලබා ගැනීම සඳහා A සම්බන්ධ කරගැනීමට හැකියාව තිබුණි. එහෙත් B එසේ නොකරන ලදී. එම නිසා ඉහත සඳහන් 1 වන කොන්දේසිය සපුරා නැත. එම නිසා අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය A සහ B අතර නිර්මානය වී නොමැත.

ඒ හේතුවෙන්, නවාතැන් බිල්පත B විසින් දැරිය යුතුය.

මීට සමාන කරුණු ජී.එන්.රයි එදිරිව ස්වැෆල්ඩ් (1874) *L.R.9Ex.132. , නඩුවේදී සාකච්ඡා කරන ලදී.*

එම නඩුවට අනුව, අශ්වයකු දුම්රියෙන් යවනු ලැබූ, අශ්වයා දුම්රිය ස්ථානයට ළඟා වූ විට බාරගැනීමට කෙනකු නොමැති විය. අයිතිකරු සම්බන්ධකර ගැනීමට නොහැකි වූ දුම්රිය සමාගම අශ්වයා රාත්‍රියේ ඉස්තාලයකට දමන ලදී.

*තීන්දුව :*

ප්‍රධානියා සම්බන්ධ කර ගැනීමට නොහැකි අවස්ථාවකදී අශ්වයා ආරක්ෂා කිරීමට යමක් කිරීමට දුම්රිය සමාගම බැඳී සිටී.

එම නිසා ප්‍රධානියා ඉස්තාලයේ රඳවා තැබීමේ ගාස්තු ගෙවිය යුතුවේ.

**හෝ**

ස්ප්‍රින්ගර් එදිරිව ජ ඩබලිව් ආර්වයි (1921)
S විසින් ජර්සි සිට ලන්ඩන් දක්වා තක්කාලි තොගයක් නැව්ගත කරන ලදී. නැව දින තුනකට පසු වේමත් වලට තක්කාලි ගෙන යන ලද නමුත් දුම්රිය වැඩ වර්ජනයක් නිසා දින දෙකක් යන තුරු ගොඩ බෑමට නොහැකි විය. තක්කාලි ගොඩ බෑ පසු ඒවා නරක් වී යන බව පෙනී ගිය නිසා ඒවා එහිදී විකුණා දමන ලදී. දුම්රිය සමාගම මේ සඳහා S ගෙන් උපදෙස් ලබා ගත්තේ නැත.

තීරණය: දුම්රිය සමාගම හැකියාව තිබියදීත් S දැනුවත් කර ඔහුගෙන් උපදෙස් ලබා නොගත් නිසා අධිකරණය දුම්රිය සමාගම වගකීමට යටත් කරන ලදී.

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

# නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම"' යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු"' ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

    මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිදු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**